00012

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා වැඩ සටහන - **3** වන මට්ටම

අවසාන පරීක්ෂණය - **2020/2021**

**EPD3336/ESD1136 -** මුල් ළමාවිය ආයතන සහ ප්‍රාථමික පාසල් කළමනාකරණය

කාලය - පැය දෙකයි. (02)

---

දිනය - 2023.07.30 වේලාව - ප.ව.01.30 - ප.ව.03.30 දක්වා

---

1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. පෙර පාසලක කළමනාකරණය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

02. නායකත්ව ගුණාංග පහක් (05) ලියන්න.

03. "ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය" යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

04. පෙර පාසලක ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කිරීමෙන් ලැබිය හැකි වාසි මොනවා ද?

05. කළමනාකරණ ක්‍රියාවලිය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

06. පෙර පාසල් දරුවන්ට සුදුසු සෙල්ලම් පිටියක් සකස් කිරීමේ දී සලකා බැලිය යුතු වැදගත් කරුණු පහක් (05) ලියන්න.

07. පෙර පාසලක ප්‍රජා සම්පත් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

08. දිවා සුරැකුම් මධ්‍යස්ථානයක කාර්යයන් පහක් (05) ලියන්න.

(ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) පෙර පාසලක ගුරුවරිය විසින් පෙර පාසල තුළ දෛනික ක්‍රියාකාරකම් ඵලදායී ලෙස සැලසුම් කරන අයුරු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

    (ii) ළමා ක්‍රියාකාරකම් සඳහා පෙර පාසලක හෝ ප්‍රාථමික පාසලක තිබිය යුතු ඉගෙනුම් ද්‍රව්‍ය **පහක් (05)** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 10)

10. (i) පෙර පාසලක ඉගෙනුම් පරිසරය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 05)

    (ii) පෙර පාසලක හෝ ප්‍රාථමික පාසලක ඵලිමහන් ඉගෙනුම් පරිසරය සංවිධානය කරන ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15)

11. (i) පෙර පාසලක "මූල්‍යමය සම්පත්" යන යෙදුම කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

    (ii) පෙර පාසලේ දී හෝ ප්‍රාථමික පාසලේ දී ගුරුවරයකු වශයෙන් ඔබ මානව සම්පත් කළමනාකරණය කරන අයුරු කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

    (iii) පෙර පාසලක් හෝ ප්‍රාථමික පාසලක් පවත්වාගෙන යෑමේ දී කළමනාකරණය පිළිබඳ දැනුම භාවිතය තුළින් ගුරුවරයකුට ලබාගත හැකි වාසි **පහක් (05)** සඳහන් කරන්න. (ලකුණු 05)

12. (i) පෙර පාසලක් පිහිටුවීමට සුදුසු ඉඩමක් තෝරා ගැනීමේ දී සැලකිල්ලට ගතයුතු අංශ දක්වන්න. (ලකුණු 05)

    (ii) පෙර පාසලක දෛනික සැලසුමක ඇතුලත් විය යුතු ප්‍රධාන අංග ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

    (iii) පෙර පාසල් ගුරුවරයකු ළමුන්ගේ ප්‍රගතිය තක්සේරු කරන අයුරු උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

13. පහත සඳහන් මාතෘකා **දෙකක් (02)** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

    (i) සදාචාර සංවර්ධන අවධි

    (ii) "SMART" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

    (iii) සැලසුම්කරණය සහ පාලනය අතර ඇති සම්බන්ධතාව

(ලකුණු 10 x 02 = 20)

හිමිකම් ඇවිරිණි.